# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල
## (සංශෝධන)

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා විසින්
2026 ජූලි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 මාර්තු මස 13 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[70 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 86.50** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 16 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට අලුත් ඡේදයක් ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 64 වන වගන්තිය යටතේ මණ්ඩලය වෙත පවරනු ලබන්නා වූ, යම් කාර්මික වතුයායකට, කර්මාන්ත උද්‍යානයකට හෝ ප්‍රජාපාදක සංවිධානයකට අයත් ජල සම්පාදන හෝ කසළාපවහන කාර්යයක් භාර ගැනීම සහ කරගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එහි බලතල වැඩි කිරීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 19 වන වගන්තිය යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් ආරාවුලක් පැන නඟින අවස්ථාවක දී, කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, මණ්ඩලයට පිරියම් පිරියත සහ ජලනළ මාර්ග ඉදිකිරීම සඳහා විධිවිධාන සැලසීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා විසින් ජල සැපයුම අත්හිටුවනු ලැබිය හැකි හෝ යම් උපකරණයක් ඉවත් කරනු ලැබිය හැකි හේතු නිශ්චිතව දැක්වීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි වරයාට හෝ සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී පොලිස් නිලධරයකු එක්ව යාම සඳහා විධිවිධාන සැලැස්වීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***8 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, අය විය යුතු මුදල සම්බන්ධයෙන් වන බැලූබැල්මට පොතක සාක්ෂියක් වශයෙන් මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාගේ සහතිකය පිළිගැනීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටස සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ කොටසෙහි නීතිය බලපෑම වනුයේ, සාමාන්‍ය සංශෝධනයක් ලෙස කර්මාන්ත වතුයාය, කර්මාන්ත උද්‍යාන සහ ප්‍රජාපාදක සංවිධාන ඇතුළත් කිරීම වේ.

***10 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියට 57අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ, කර්මාන්ත වතුයායක, කර්මාන්ත උද්‍යානයක හෝ ප්‍රජාපාදක සංවිධානයක ජල සම්පාදන සහ කසළාපවහන කර්මාන්ත සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***11 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියට 83අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මණ්ඩලයේ සේවානියුක්තයන් සඳහා වන රක්ෂණ ගිවිසුම් සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***12වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම කොටසෙහි නීතිය බලපෑම වනුයේ, සාමාන්‍ය සංශෝධනයක් ලෙස කර්මාන්ත වතුයාය, කර්මාන්ත උද්‍යාන සහ ප්‍රජාපාදක සංවිධාන ඇතුළත් කිරීම වේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, මනුවක් මාර්ගයෙන් ජල සැපයුම් ප්‍රවාහය ආපසු හැරවීම වරදක් බවට පත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 84උ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියට 85අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ, කසළාපවහන සේවා සඳහා වන ගාස්තු නියම කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, මණ්ඩලය විසින් ජල සම්පාදන හෝ කසළාපවහන ගාස්තු සම්බන්ධයෙන් වන ඉල්ලීමක් යැවීමේ ක්‍රම නිශ්චිතව දැක්වීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, දැන්වීමක් යැවීමේ ක්‍රම නිශ්චිතව දැක්වීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***17 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි අතිරේක කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***18 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියට 97ආ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ, නාස්ති කරන ලද, අවභාවිත කරන ලද හෝ අනිසි ලෙස පරිභෝජනය කරන ලද ජලයෙහි වටිනාකම කඩිනමින් අය කර ගැනීම සම්බන්ධයෙන් වන හරයාත්මක සහ කාර්යපටිපාටිමය නීතිය සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***19 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීම මගින් 100 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන)

එල්. ඩී.- ඕ 13/2022

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක      දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන පනතේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> "(ඇ) 64 වන වගන්තිය යටතේ ස්වේච්ඡාවෙන් පවරා දීමේ නියෝගයකින් හෝ අනිවාර්ය පැවරීමේ නියෝගයකින් මණ්ඩලය වෙත පවරනු ලබන්නා වූ ද, යම් පළාත් පාලන ආයතනයකට, කර්මාන්තපුරයකට, කර්මාන්ත උද්‍යානයකට හෝ ප්‍රජාමූල සංවිධානයකට අයත් වූ ද ජල සම්පාදන හෝ කසළාපවහන කාර්යයක් භාර ගැනීම සහ කරගෙන යාම;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

PL 15855 - 342(2026/07)

"(අඅ) මතුපිට සහ භූගත ජල විභවවලින් ජලය ලබා ගැනීම සඳහා යම් තැනැත්තකු සමඟ ගිවිසුම්වලට එළඹීම;";

(2) එහි (ඇ) ඡේදයේ "අත්කර ගැනීම, සතුව තබා ගැනීම" යන වචන වෙනුවට "අත්කර ගැනීම, මිල දී ගැනීම, සතුව තබා ගැනීම" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (ඒ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(ඒඅ) යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ තැනැත්තකු හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරන යම් මණ්ඩලයක් සමඟ සහයෝගීතාවයෙන් යුතුව ජල සම්පාදන සහ කසළාපවහන සේවා සැපයීම, සංවර්ධනය සහ පවත්වාගෙන යාම සඳහා මතුපිට සහ භූගත ජල විභව සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් වන කටයුතුවල නිරත වීම;

(ඒආ) ඍජුව හෝ වක්‍රව සම්බන්ධතා ප්‍රවර්ධනය කරනු ලබන හෝ මණ්ඩලයේ අරමුණු ඉටු කර ගැනීමට උපකාර වන බව මණ්ඩලයේ මතය විය හැකි 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව යම් පරිපාලිත සංවිධානයක් හෝ උපායමාර්ගික ව්‍යාපාර ඒකකයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ඒඇ) අමාත්‍යවරයාගේ ලිඛිත විධාන ඇතිව, ඍජුව හෝ මේ වගන්තියේ (ඒආ) වන ඡේදය යටතේ පිහිටුවන ලද යම් පරිපාලිත සංවිධානයක් හෝ උපායමාර්ගික ව්‍යාපාර

ඒකකයක් හරහා හෝ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ මණ්ඩලයේ එයට සමාන අරමුණු සහිත වෙනත් යම් ආයතනයක් සමඟ සම්බන්ධව ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත-

(i) ජල සම්පාදනය සහ අපජලය කළමනාකරණය සම්බන්ධයෙන් උපදේශක සහ උපදේශන සේවා, පුහුණු කිරීම් සහ දැනුම බෙදා දීම්, පර්යේෂණ සහ සංවර්ධනය සැලසීම;

(ii) ජල සම්පාදනය සහ අපජලය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් පුහුණු කිරීමේ පහසුකම්, වැඩසටහන් සැලසීම;

(iii) ජල සම්පාදනය සහ අපජලය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වන ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම සහ සුදුසු අවස්ථාවන්වල දී ඩිප්ලෝමා ප්‍රදානය කිරීම; සහ

(iv) සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළු පැවැත්වීම;

(ඒඇ) තිරසර සංවර්ධනය සහ ප්‍රජාමූල ජල සම්පාදනය කිරීමේ සේවා සැපයීම වැඩි දියුණු කිරීම ප්‍රවර්ධනය කිරීමට තාක්ෂණික සහාය සැපයීම සඳහා යම් රජයේ දෙපාර්තමේන්තුවක් හෝ අමාත්‍යවරයා

විසින් අනුමත කරන ලද වෙනත් යම් ආයතනයක් සමඟ යම් එකඟතාවයන්ට එළඹීම සහ එම සියලු එකඟතාවයන් ඉටු කිරීම;

(ඒඉ) යම් රජයේ හෝ පෞද්ගලික ක්ෂේත්‍රයේ අස්තිත්වයකට හෝ යම් තැනැත්තකුට රසායනාගාර සේවා සැපයීම සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයාගේ අනුමතය සහිතව මණ්ඩලය විසින් කලින් කලට, නියම කරනු ලබන යම් ගාස්තුවලට අනුකූලව ඒ සේවාවන්ට ගාස්තු අය කිරීම;

(ඒඊ) යම් දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලකින් බැංකු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම;".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්; සහ

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) (1) වන උපවගන්තිය යටතේ තීරණයක් ගැනීමට පෙර අමාත්‍යවරයා විසින් මණ්ඩලයට සහ 19 වන වගන්තියේ සඳහන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවට හෝ පුද්ගල මණ්ඩලයට කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දිය යුතු ය.".

**5.** 22 වන වගන්තියේ "ටැංකි, ජලපිහිලි සහ" යන වචන වෙනුවට "ටැංකි, ජලපිහිලි, පිරියම් පිරියත, නළ මාර්ග හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "මණ්ඩලයේ දේපළට කරන ලද යම් හානියක් වෙනුවෙන් ඔහුගෙන් අලාභය අයකර ගැනීමට මණ්ඩලයට ඇති අයිතියට සහ, නාස්ති කරන ලද, අනිසි ලෙස භාවිත කරන ලද හෝ අවභාවිත කරන ලද ජලයෙහි වටිනාකම අයකර ගැනීමට මණ්ඩලයට ඇති අයිතියට හානියක් නොමැති ව, ඒ එක් එක් වරද සඳහා රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය." යන වචන වෙනුවට, "මණ්ඩලයේ දේපළට කරන ලද යම් අලාභයක් වෙනුවෙන් ඔහුගෙන් අලාභය අයකර ගැනීමට මණ්ඩලයට ඇති අයිතියට සහ සාමාන්‍යාධිකාරිවරයාගේ කැමැත්ත නොමැතිව උපකරණයකට හෝ වෙනත් නළයකට හෝ පයිප්පයක් හෝ උපකරණයක් හෝ සවි කිරීම මගින් නාස්ති කරන ලද, අනිසි ලෙස භාවිත කරන ලද හෝ අවභාවිත කරන ලද ජලයෙහි වටිනාකම අයකර ගැනීමට මණ්ඩලයට ඇති අයිතියට හානියක් නොමැතිව, ඒ එක් එක් වරද සඳහා රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා හෝ තත් කාර්යය සඳහා සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් ජල සැපයුම

අත්හිටුවීම හෝ සාමාන්‍යාධිකාරිවරයාගේ කැමැත්ත නොලබා සවි කරන ලද එවැනි යම් නළයක් හෝ උපකරණයක් ඉවත් කරනු ලැබීම කරනු ලැබිය හැකි ය.”; සහ

(3) එහි නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ලෙස අංකනය කරනු ලැබිය යුතු පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන්:-

“(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, මණ්ඩලයේ දේපළකට කරන ලද යම් අලාභයක් සම්බන්ධයෙන් අලාභයේ ප්‍රමාණය සහ නාස්ති කරන ලද, අනිසි ලෙස භාවිත කරන ලද හෝ අවභාවිත කරන ලද ජලයෙහි වටිනාකම සඳහන් කරමින් සාමාන්‍යාධිකාරිවරයා විසින් හෝ සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් සකස් කර අත්සන් කරන ලද සහතිකයක් අය විය යුතු මුදල් ප්‍රමාණයට බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් අපරාධ නඩු කටයුත්තක දී අවස්ථාවෝචිත පරිදි, සාමාන්‍යාධිකාරිවරයා විසින් හෝ සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ ඒ සහතිකය ගොනු කිරීමෙන් පසුව, ඒ තැනැත්තාට එරෙහිව අය විය යුතු බවට දක්වා ඇති මුදල් ප්‍රමාණය අය කර ගැනීම සඳහා ඒ තැනැත්තාට එරෙහිව වැඩිදුර නඩු කටයුතු පවත්වා නොගැනීමට හේතු දැක්වීමට මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට අවස්ථාවක් සලස්වනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා ප්‍රමාණවත් හේතුවක් නොදක්වනු ලබන අවස්ථාවක දී, අය විය යුතු බවට දක්වා ඇති මුදල හෝ යම් අඩු මුදලක් අධිකරණය විසින් පනවන ලද දඩයක් වශයෙන්

අය කර ගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගත් මුදල මණ්ඩලයේ පොදු සංචිත අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(1අ) (1) වන උපවගන්තිය යටතේ කාර්ය ඉටු කිරීමේ දී ඒ සාමාන්‍යාධිකාරිවරයාට හෝ සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකුට යම් බාධාවක් ඇති විය හැකි බවට සැක කිරීමට සාධාරණ හේතුවක් ඇති අවස්ථාවක දී, ඒ ඉඩමට හෝ පරිශ්‍රයට පොලිස් නිලධරයකු සමඟ ඇතුළු විය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ “තව ද එවැනි සෑම තැනැත්තෙක් ම” යන වචන වෙනුවට “තව ද මණ්ඩලයේ දේපළකට කරන ලද යම් අලාභයක් වෙනුවෙන් හෝ ජල කර්මාන්තවලට අයත් යම් ජලය අපවිත්‍ර කිරීමක් වෙනුවෙන් ඒ තැනැත්තාගෙන් අලාභය අයකර ගැනීමට මණ්ඩලයට ඇති අයිතියට හානියක් නොමැතිව, එවැනි සෑම තැනැත්තෙක් ම” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා මණ්ඩලයේ දේපළකට කරන ලද යම් හානියක් සම්බන්ධයෙන් හෝ ජල කර්මාන්තයට අයත් යම් ජලය අපවිත්‍ර කිරීමක් සම්බන්ධයෙන් අලාභයේ ප්‍රමාණය සඳහන් කරමින් සාමාන්‍යාධිකාරිවරයා හෝ සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් සකස් කර අත්සන් තබන ලද සහතිකයක්, අය විය යුතු මුදලට බැලූබැල්මට සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් අපරාධ නඩු කටයුත්තක දී අවස්ථාවෝචිත පරිදි, සාමාන්‍යාධිකාරිවරයා විසින් හෝ සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ ඒ සහතිකය ගොනු කිරීමෙන් පසුව ඒ තැනැත්තාට එරෙහිව අයවිය යුතු බවට දක්වා ඇති මුදල අයකර ගැනීමට ඒ තැනැත්තාට එරෙහිව වැඩිදුර නඩු කටයුතු පවත්වාගෙන නොයාමට හේතු දැක්වීමට මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට අවස්ථාවක් සලස්වනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා ප්‍රමාණවත් හේතුවක් නොදක්වනු ලබන අවස්ථාවක දී, අයවිය යුතු බවට දක්වා ඇති මුදල හෝ යම් අඩු මුදලක් අධිකරණය විසින් පනවන ලද දඩයක් වශයෙන් අය කර ගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගත් මුදල මණ්ඩලයේ පොදු සංචිත අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසට සාමාන්‍ය සංශෝධනයක් සිදු කිරීම*

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසේ "පළාත් පාලන ආයතනය" හෝ "ආයතනය" යන වචන හෝ වචනය යෙදෙන ඕනෑම තැනක් වෙනුවට "පළාත් පාලන ආයතනය, කර්මාන්තපුරය හෝ කර්මාන්ත උද්‍යානය හෝ ප්‍රජාමූල සංවිධානයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ කොටස මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 57අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:- ප්‍රධාන ප්‍රඥප්තියේ 57අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"කර්මාන්තපුරයක, ආදියේ ජල සම්පාදනය සහ කසළාපවහන කර්මාන්ත

**57අ.** මේ පනතේ III වන කොටසේ විධිවිධාන කර්මාන්තපුරයක, කර්මාන්ත උද්‍යානයක හෝ ප්‍රජාමූල සංවිධානයක යම් ජල සම්පාදන සහ කසළාපවහන කර්මාන්ත මණ්ඩලයට පැවරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය:

එසේ වුව ද, -

(අ) කර්මාන්තපුරයක හෝ කර්මාන්ත උද්‍යානයක ජල සම්පාදනය සහ කසළාපවහන කර්මාන්ත ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විටක දී, "පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා" යන වචන ඒ කොටසේ යෙදෙන ඕනෑම තැනක දී අවස්ථාවෝචිත පරිදි, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විෂයය පවරන ලද අමාත්‍යවරයා" හෝ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ කර්මාන්ත විෂයය පවරා ඇති අමාත්‍යවරයා" යන්නට කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම්ගනු ලැබිය යුතු ය; සහ

(ආ) ප්‍රජාමූල සංවිධානයක ජල සම්පාදන හෝ කසළාපවහන කර්මාන්ත ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විට දී, ‘‘පළාත් පාලන ආයතන විෂයය භාර අමාත්‍යවරයා’’ යන වචන ඒ කොටසේ යෙදෙන ඕනෑම තැනක දී, ‘‘ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන සහ 45 වන ව්‍යවස්ථාවන් යටතේ ප්‍රජාමූල ජල සම්පාදන විෂයය පවරන ලද අමාත්‍යවරයා’’ පිළිබඳ කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම්ගනු ලැබිය යුතු ය.’’.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 83අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

‘‘රක්ෂණ ගිවිසුම්

**83අ.** (1) අවස්ථාවෝචිත පරිදි -

(අ) රාජකාරියේ යෙදී සිටිය දී යම් සේවානියුක්තයකු විසින් දරන ලද; හෝ

(ආ) (i) රාජකාරියට වාර්තා කිරීම සඳහා සේවානියුක්තයකු ඔහුගේ පදිංචි ස්ථානයේ සිට ස්වකීය රාජකාරි ස්ථානය දක්වා; හෝ

(ii) රාජකාරියෙන් පසු සේවානියුක්තයකු රාජකාරි ස්ථානයේ සිට ස්වකීය පදිංචි ස්ථානය දක්වා,

ගමන් කරන අතරතුර දී ඔහු විසින් දරන ලද; හෝ

(ඇ) රාජකාරියේ යෙදී නොසිටින අතරතුර යම් සේවානියුක්තයකුගේ සාමාන්‍ය කාර්ය විෂයපථය තුළ යම් ක්‍රියාවක් ඉටු කිරීමේ දී ඔහු විසින් දරන ලද; හෝ

(ඈ) යම් සේවානියුක්තයකුගේ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී යම් ක්‍රියාවකට හෝ ඉටු කිරීමකට ආනුෂංගිකව ඒ සේවානියුක්තයා විසින් දරන ලද; හෝ

(ඉ) යම් සේවානියුක්තයකුගේ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී ඔහු විසින් කරන ලද යම් කටයුත්තකින් සිදු වූ හෝ හටගත් යම් පලිගැනීමේ ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් ඒ සේවානියුක්තයා විසින් දරන ලද,

යම් හානියක් හේතුවෙන් නිත්‍ය වශයෙන් ආබාධිත වූ හෝ අර්ධ වශයෙන් ආබාධිත වූ හෝ තාවකාලිකව අශක්නුතාවකට පත් වූ එවැනි යම් සේවානියුක්තයකුට හෝ එවැනි යම් හානියක් හේතුවෙන් යම් සේවානියුක්තයකුගේ මරණය සිදු වුවහොත් නෛතික උරුමකරුවන්ට රක්ෂණාවරණයක් ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා මණ්ඩලයේ සේවානියුක්තයන් රක්ෂණය කරමින් මණ්ඩලය විසින් කලින් කලට, රක්ෂණ ගිවිසුම්වලට එළඹිය හැකි ය.

(2) රක්ෂණ වාරිකය ලෙස මණ්ඩලය විසින් ගෙවිය යුතු මුදල සහ රක්ෂණ ක්‍රමය, රක්ෂණයක් සඳහා හිමිකම් කීමට අවශ්‍ය වන

සුදුසුකම් සහ ඒ හා සම්බන්ධිත සියලු වෙනත් කාරණා මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් සාදන ලද රීති මගින් තීරණය කරනු ලැබිය යුතු ය.

(3) යම් සේවානියුක්තයකුගේ ආබාධිත වීම, අශක්නුතාවයට පත් වීම හෝ මරණය සම්බන්ධයෙන් මේ වගන්තියේ පෙරාතු විධිවිධාන යටතේ සාදන ලද රීතිවලට අනුකූලව ප්‍රදානය කරන ලද යම් රක්ෂණයක් මේ සම්බන්ධයෙන් අදාළ වන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එවැනි ආබාධිත වීමක්, අශක්නුතාවයක් හෝ මරණයක් සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද යම් පාරිතෝෂිකයකට, වන්දියකට, දීමනාවකට හෝ වෙනත් ප්‍රතිලාභයකට අමතරව විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන කොටසට සාමාන්‍ය සංශෝධනයක් කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන කොටසේ ''පළාත් පාලන ආයතනය'' යන වචන ඒ කොටසේ යෙදෙන ඕනෑම තැනක දී, ඒ වචන වෙනුවට ''පළාත් පාලන ආයතනය, කර්මාන්තපුරය හෝ කර්මාන්ත උද්‍යානය හෝ ප්‍රජාමූල සංවිධානය'' යන වචන ආදේශ කිරීමෙන් ඒ කොටස මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 84උ වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84උ වගන්තියේ 'අලාභ කරන හෝ වෙනත් යම් ආකාරයකින්'' යන වචන වෙනුවට ''අලාභ කරන, ප්‍රවාහය ආපසු හරවන හෝ වෙනත් යම් ආකාරයකින්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 85අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

''කසළාපවහන සේවා සඳහා වන ගාස්තු නියම කිරීම

**85අ.** (1) කසළාපවහන පද්ධතියට සම්බන්ධ කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුගේ දේපළ ද, ඒ තැනැත්තා විසින්

මණ්ඩලයට ගෙවිය යුතු කසළාපවහන සේවා ගාස්තු ජල විභවය නොසලකා කසළාපවහන පද්ධතියට කරනු ලබන මුදා හැරීම්වල එකතුව මත පදනම් විය යුතු ය.

(2) මේ නීතියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් ධාරිතාව පදනම්ව හෝ යෝජනා ක්‍රමයකට විශේෂිතව කසළාපවහන ගාස්තුවක් හඳුන්වාදෙනු ලැබිය හැකි ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) යම් තැනැත්තකු වෙත මණ්ඩලය විසින් යවන ලද ජල සම්පාදන හෝ කසළාපවහන ගාස්තු සම්බන්ධයෙන් වන ඉල්ලීම ලියාපදිංචි හෝ සාමාන්‍ය තැපැල මගින් යැවිය හැකි අතර, අතින් හෝ යම් ඉලෙක්ට්‍රොනික මාර්ගයකින් භාර දිය හැකි ය.''; සහ

(2) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ, "ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය;'' සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වන සියලු වචන වෙනුවට "ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, "ඒ සේවය නතර කරනු ලැබිය හැකි ය.'' යන වචන වෙනුවට "ඒ සේවය නතර කරනු ලැබිය හැකි ය. මේ උපවගන්තියේ විධිවිධාන යටතේ අවශ්‍ය වන දැන්වීම ලියාපදිංචි

හෝ සාමාන්‍ය තැපැල මගින් යැවිය හැකි අතර, අතින් හෝ යම් ඉලෙක්ට්‍රොනික මාර්ගයකින් භාරදිය හැකි ය.'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඒ) වන ඡේදයේ අවසානයේ ඇති ''සහ'' යන වචන ඉවත් කිරීමෙන්;

(2) එහි (ඔ) වන වගන්තියේ ''පාලනය කිරීම.'' යන වචන වෙනුවට ''පාලනය කිරීම;'' යන වචන ආදේශ කිරීමෙන්, සහ

(3) එහි (ඔ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති එකතු කිරීමෙන්:-

''(ඕ) තත්කාර්ය සම්බන්ධයෙන් වන ඒවායේ සුලභතාවය සහ ගාස්තුවලට යටත්ව, හදිසි පදනම මත ජල සම්පාදනය හෝ කසළාපවහන සේවා සම්බන්ධතාවය සැපයීම;

(ක) ජලවිද්‍යාත්මක රක්ෂිත හෝ මතුපිට සහ භූගත ජල විභව තුළුම්ංවල ආරක්ෂාව සඳහා රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම සහ ඒවායේ ආරක්ෂාව සඳහා විධිවිධාන සැලැස්වීම;

(ග) අපජලය පොදු මල නළවලට සහ පිරියම් පිරියතවලට මුදා හැරීම් සඳහා වන ප්‍රමිතීන් හෝ නිර්ණායක නිශ්චිතව සඳහන් කිරීම;

(ච) ප්‍රමිතීන් සහ නිර්ණායකවලට අනුකූල නොවන අපජලය යම් මළනළ සහ පිරියම් පිරියතවලට මුදා හැරීම් වැළැක්වීම සහ

එවැනි අපජලය මුදා හැරීම් හේතුවෙන් මණ්ඩලයට ඇති වූ වියදම් සහ හානි අයකර ගැනීම;

(ජ) විමධ්‍යගත අපජලය පිරියම් පිරියත (ඩී.ඊ.ඩබ්.ඒ.ටී.එස්.) සහ අපද්‍රව්‍ය රැස් කර දිරා පත් වීමට සලස්වන පිරියම් පිරියත ඇතුළුව ස්ථානීය මළාපවහන පද්ධති ගොඩනැගීම;

(ට) තත්කාර්යය සඳහා පාවිච්චි කළ යුතු උපකරණවල සහ බහාලුම්වල ප්‍රමාණය, ස්වභාවය, ශක්ති ප්‍රමාණය සහ ද්‍රව්‍ය ඇතුළුව මළාපවහන පද්ධති ගොඩනැඟීම සඳහා වන ප්‍රමිතීන් සහ පිරිවිතර සැකසීම;

(ඩ) ජල සම්පාදනය සහ කසළාපවහන සේවාවලට අදාළ උපදේශක, උපදේශන සහ ඉදිකිරීම් සේවා ආකාරයෙන් වන තාක්ෂණික සේවා සැපයීමෙහි නිරත වන තැනැත්තන් ලියාපදිංචි කිරීම; සහ

(ණ) මණ්ඩලය විසින් පොදු කටයුතු, ගෘහ කටයුතු හෝ කාර්මික කටයුතු සඳහා සපයන ලද ජලයේ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 97ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 97අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 97ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“යම් නාස්ති කරන ලද, අනිසි ලෙස භාවිත කරන ලද හෝ අවභාවිත කරන ලද ජලයෙහි වටිනාකම අය කර ගැනීමට මණ්ඩලයට අයිතිය ඇති බව

**97ආ.** (1) 28 වන, 30 වන, 32 වන, 33 වන, 34 වන, 84ඊ වන සහ 84උ වන වගන්ති යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් පනවන ලද යම් දඩයක් යම් නාස්ති කරන ලද, අනිසි ලෙස භාවිත කරන ලද හෝ අවභාවිත කරන ලද ජලයෙහි වටිනාකම අය කර ගැනීමට මණ්ඩලය සතු අයිතියට අගති විරහිතව විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් නාස්ති කරන ලද, අනිසි ලෙස භාවිත කරන ලද හෝ අවභාවිත කරන ලද ජලයෙහි වටිනාකම සඳහන් කරමින් සාමාන්‍යාධිකාරිවරයා විසින් හෝ සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් අත්සන් කරන ලද සහතිකයක් අයවිය යුතු මුදල් ප්‍රමාණය පිළිබඳ බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් අපරාධ නඩු කටයුත්තක දී අවස්ථාවෝචිත පරිදි, සාමාන්‍යාධිකාරිවරයා හෝ සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් මහෙස්ත්‍රාත් අධිකරණයේ ඒ සහතිකය ගොනු කිරීමෙන් පසුව මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට එරෙහිව අය විය යුතු බවට පෙන්වා ඇති මුදල අය කර ගැනීම සඳහා වැඩිදුර නඩු කටයුතු පවත්වාගෙන නොයාමට හේතු දැක්වීමට මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට අවස්ථාවක් ලබා දිය යුතු අතර, ඒ තැනැත්තා ප්‍රමාණවත් හේතුවක් නොදක්වනු ලබන අවස්ථාවක දී, අය විය යුතු බවට පෙන්වා ඇති මුදල හෝ යම් අඩු මුදලක් අධිකරණය විසින් පනවන ලද දඩයක් ලෙස අය කර ගනු ලැබිය යුතු අතර, එසේ අය කර ගත් මුදල මණ්ඩලයේ පොදු සංචිත අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.”.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) “බල ප්‍රදේශය” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

"""මණ්ඩලය" යන්නට, යම් සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයක් ඇතුළත් වේ;

"ප්‍රජාමූල සංවිධාන" යන්නෙන්, පරිශීලක ප්‍රජාව වෙත ජල සම්පාදනය හෝ කසළාපවහන සේවා සැපයීමෙහි නිරතව සිටින පරිශීලක ප්‍රජාව නියෝජනය කරන්නා වූ සංවිධානයක් හෝ මණ්ඩලයක් අදහස් වේ;

"කර්මාන්තපුරය" යන්නෙන්, 1969 අංක 36 දරන කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද කර්මාන්තපුරයක් හෝ 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ විධිවධාන යටතේ පිහිටුවන ලද කර්මාන්තපුරයක් අදහස් වේ;

"කර්මාන්ත උද්‍යානය" යන්නෙන්, 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද කාර්මික උද්‍යානයක් අදහස් වේ;"

(2) "පළාත් පාලන සේවා කොමිෂන් සභාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"""තැනැත්තා" යන්නට, ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු ඇතුළත් වේ;" ; සහ

(3) "කසළාපවහන කර්මාන්ත" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

“““තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව” යන්නෙන්, 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව අදහස් වේ;”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.